දූෂණය පිටුදැකීමට තරුණ කොටස්වල දැඩි කැපවීමක්

මෙරටින් දූෂණය පිටුදැකීම සඳහා තරුණ කොටස්වල පවතින අවංක උනන්දුව සහ කැපවීම ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා ආයතනය විසින් පවත්වනු ලැබූ දූෂණ විරෝධී නිබන්ධන තරගාවලියට හිමිවූ අවධානය හරහා විශේෂයෙන් කැපී පෙනුණි.

සුපිළිපන් බව සුරැකුණු සමාජයක් පෙරදැරි කරගත් එම තරගය සඳහා නිබන්ධන සිය ගණනක් ඉදිරිපත් කර තිබුණි. ඒ අතුරින් අදාළ නියමයන්ට අනුව ලියැවුණු නිබන්ධන 452 ක් භාෂා ත්‍රිත්වයෙන්ම තෝරාගන්නා ලදි.

එහිදී වැඩිම නිබන්ධ සංඛ්‍යාවක් තෝරාගත හැකි වූයේ දෙමළ මාධ්‍යයෙනි. දෙමළ මාධ්‍යයෙන් නිබන්ධන 254 ක් ඊනිශ්වය මණ්ඩලය සඳහා යොමුකරුණු අතර සිංහල මාධ්‍යයෙන් නිබන්ධන 157ක් ද ඉංග්‍රීසි මාධ්‍යයෙන් නිබන්ධන 41 ක්ද තෝරාගැනිණි.

මෙම නිබන්ධන සකස් කළ යුතු ආකාරය පහැදිලි කිරීම සඳහා ට්‍රාන්ස්පේරන්සි ශ්‍රී ලංකා ආයතනය අම්පාර, මඩකළපුව, කොළඹ, යාපනය, මහනුවර සහ මාතර යන දිස්ත්‍රික්කවල සම්මන්ත්‍රණ 13 ක් පවත්වනු ලැබීය.

සිංහල මාධ්‍යයේ පළමු ස්ථානය හිමිකරගැනීමට සමත්වූයේ කොළඹ නීති පීඨයේ නයිමුඩීන් සියානය. කොළඹ නීති පීඨයේ රංගන ද සිල්වා සහ රහුණු සරසවියේ සමාජ විද්‍යා පීඨයේ නිමේෂිකා ද සිල්වා දෙවන හා තෙවන ස්ථානයන් දිනාගත්තේය.

දෙමළ මාධ්‍යයේ පළමු ස්ථානය හිමිකරගනු ලැබුවේ පෙයරිආබා පෙරාරියන්ය. ඔහු යාපනය සරසවියේ සිසුවෙකි. එම සරසවියේම රොසාරි ශ්‍රියාන්තන් දෙවන ස්ථානයත් පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ දේශපාලන පීඨයේ ජ්‍යොතිශයාණ්ඩි සිවකුමාර් තුන්වන ස්ථානයත් දිනාගත්හ.

ඉංග්‍රීසි මාධ්‍යයේ පළමු ස්ථානය හිමිකර ගනු ලැබුවේ පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ කලා පීඨයේ ඉගෙනුම ලබන උපාලි ජීරමෝග් හික්ෂුන් වහන්සේය. පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ පද්මනාදන් සිවකුමාර් එහි දෙවන ස්ථානය දිනාගත් අතර තෙවන ස්ථානය හිමිකරගනු ලැබුවේ මොරටුව විශ්ව විද්‍යාලයේ ඉංජිනේරු පීඨයේ සිත්තිවානයගමේ කෝකුල කුමරන්ය.

මහාචාර්ය සරත් වීජේසූරිය, නිහිඟිඳ සහ පුවත්පත් තීරු ලිපි රචක එස්.ජී. පුංචිහේවා, ජ්‍යෙෂ්ඨ පර්යේෂක සත්පන හත්තොටුව සමාජ සේවිකාවක් වන සිතාරා ශ්‍රීන් සහ නිහිඟිඳ ඊ.වී. තම්ලිමාරන් විනිශ්චය මණ්ඩලය ලෙස කටයුතු කළහ.

'අත්දැකීමෙන් දූෂණය පිටුදකිමු'

ජීවත්වීම උදෙසා ඔබට තිබෙන අයිතිය ඔබ සාධාරණීකරණය කරන්නේ කොහොමද ? ඔබ කෙදිනක හෝ බසයක ගමන් කරද්දී ඔබ ඉතා අමාරුවෙන් ලබාගත් ආසනය මහළු පුද්ගලයෙකුට පරිත්‍යාග කර සතුටුවී තිබේද ? ඔබේ අනාගත දරුවන්ගේ පිපාසිත මුහුණු දැක දැකත් ඔබ තවමත් ජලය නාස්ති කරනවාද ? ඔබ දරුණ හිලයේ බලය අපයෝජනය කිරීමට ඉතා සුලබ අවස්ථා තිබියදී ඔබ තවමත් අපිරිසිදු නොවූ දෑතකට හිමිකම් කියනවාද ? එසේනම් ඔබට සුභ පැතුම් ! ඔබ තවමත් මිනිසෙකු ලෙස ජීවත්වෙනවා.

නයිමුඩීන් සියානා

මෙසේ සඳහන් කළේ දූෂණ විරෝධී නිබන්ධන තරගයේ සිංහල මාධ්‍යයෙන් ජයග්‍රහණය කළ නයිමුඩීන් සියානා ශිෂ්‍යාවිය. දැනට කොළඹ විශ්ව විද්‍යාලයේ නීති පීඨයේ ඉගෙනුම ලබන ඇය වැඩිදුරටත් මෙසේද පැවසුවාය.

උපකල්පයකින් ලෝකයේ අල්ලස හෝ දූෂණය අවසන් කළ නොහැකියි. ඔබේ ළමා කාලයේ සිට ඔබ ලබන අත්දැකීම්, අවවාද මගින් පමණයි මෙලොව අල්ලස හා දූෂණය වැළැක්විය හැක්කේ. ඔබ ඔබේ දරුවාටත් එවන් අනාගතයක් උරුම කර දෙන්නැයි මා ඔබෙන් ඉල්ලා සිටිනවා.

මම ආසයි කවදාහරි මා මැරෙන මොහොතේ කවදාවත් මම වැරැද්දක් සිදුකර නැහැ. මම ජීවිතයේ පසුතැවිලි වෙලා නැහැ. කියන සිතුවිල්ල සමඟ මිය යන්න.

ලෝකයේ උසස්ම පුද්ගලයා යනු ධනයෙන් හෝ බලයෙන් ඉදිරියට ගිය පුද්ගලයා නොවෙයි. මනසින් උසස් පුද්ගලයා වන්නේ කිසිදාක පසුතැවිලි නොවී ඉතාමත් ලස්සන ජීවිතයක් ගතකර මියයන පුද්ගලයායි.

පූජ්‍ය උපාලි ප්‍රාමොත්
ජෙයසිරිබා ජෙයකීර්ත්වරන්

රාජ්‍ය දේපල අයථා පරිහරණය ගැන පැමිණිලි 400 ඉක්මවයි

මැතිවරණ කටයුතු සඳහා රාජ්‍ය දේපල අයථා ලෙස පරිහරණය කිරීමෙන් සිදුවන මහජන මුදල් නාස්තිය අවම කිරීමේ අරමුණින් ක්‍රියාත්මක කරන ලද 'පොදු දේපල රැකගැනීමේ වැඩසටහන' වෙත පනාධිපතිවරණයට අදාළ පැමිණිලි 400 කට අධික ප්‍රමාණයක් ලැබී තිබූ අතර එයින් වැඩිම ප්‍රමාණය වාර්තා වී ඇත්තේ රජයේ වාහන හා ලංගම බස්රථ අයථා ලෙස යොදාගැනීම සම්බන්ධයෙනි.

ලැබී ඇති පැමිණිලි හා අපගේ විමර්ශණ අනුව පොදු දේපල අයථා පරිහරණයන් බහුතුවම සිදුවී ඇති සෙසු ක්ෂේත්‍ර වනුයේ මැතිවරණ කොමසාරිස්වරයාගේ නියෝග උල්ලංඝනය කරමින් සිදුකළ මැතිවරණ ප්‍රචාරක කටයුතු රාජ්‍ය ආයතන හා ගොඩනැගිලි අයථා පරිදි යොදාගැනීම ප්‍රමුඛ පෙළේ රාජ්‍ය නිලධාරීන් ඇතැළු රාජ්‍ය සේවකයන් මැතිවරණ කටයුතුවල යෙදීම ආදිය වේ.

මහජනතාවගෙන් අයකරන්නා බදු මුදල් විනාශ කරමින් ශ්‍රී ලංකාවේ මැතිවරණයන්හිදී සිදුකෙරෙන මෙම පොදු දේපල අයථා පරිහරණයන්හි අයහපත් වර්ධනයක් දක්නට ලැබෙන බවද ඒ පිළිබඳ අදාළ බලධාරීන්ගේ අවධානය යොමුවිය යුතු බවද පසුගිය පනාධිපතිවරණයට අදාළ පොදු දේපල අයථා පරිහරණයන් සම්බන්ධ මුලික වාර්තා 4 ක් නිකුත් කරමින් ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා ආයතනය පෙන්වා දෙනු ලැබීය. ඒ පිළිබඳ අවසන් වාර්තාව ඉදිරි මාර්තු මාසයේදී නිකුත් වීමට නියමිතය.

පසුගිය පනාධිපතිවරණය සඳහා ඉකුත් ජනවාරි 15 වා වනවිට ප්‍රධාන අපේක්ෂකයන් දෙදෙනා ප්‍රවත්පත් හා රූපවාහිනී ප්‍රචාරක දැන්වීම් සඳහා පමණක් වැයකර වැයකර තිබූ වියදම රුපියල් කෝටි 45 ක් ඉක්මවා තිබිණි. එයින් රුපියල් කෝටි 08 ක් පෙනරාල් සරත් ෆොන්සේකා මහතාගේ ප්‍රචාරක කටයුතු වෙනුවෙනි. ඉතිරි කෝටි 38 එක්සත් ජනතා නිදහස් සන්ධානය හා තාරුණ්‍යයට හෙටක් සංවිධානය එක්ව සිදුකළ පනාධිපති මහින්ද රාජපක්ෂ මහතාගේ ප්‍රචාරක කටයුතු වෙනුවෙනි.

2001 වසරේ සිට ආරම්භ කරන ලද ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා පොදු දේපල රැකගැනීමේ වැඩසටහනේ හිරිත්ක්ෂණ කටයුතු 2010 මහ මැතිවරණයට අදාළවද සිදුකිරීමට සැළසුම් කර තිබේ.

පොදු දේපල අයථා පරිහරණය වලකමු

011 5 769 769
011 5 654 654

2010 මහ මැතිවරණය සඳහා දේශපාලන පක්ෂ, ස්වාධීන කණ්ඩායම් හෝ කිසියම් අපේක්ෂකයෙක්

- රජයේ යාන වාහන, හෙලිකොප්ටර්, ගුවන්යානා ඇතුළු රජයේ ප්‍රවාහන පහසුකම්
- රාජ්‍ය හා අර්ධ රාජ්‍ය ආයතනවල (සංස්ථා, මණ්ඩල, අධිකාරි වැනි) සේවකයන්
- රාජ්‍ය මාධ්‍යයන්හි ගුවන් කාලය, මුද්‍රණ පහසුකම්
- රජයේ ගොඩනැගිලි, රාජ්‍ය මුදල්

ආදී ඕනෑම පොදු දේපලක් අයථා ලෙස පරිහරණය කරයි නම්

ඔබ දන්නා තොරතුරු අප වෙත යොමුකරන්න

පොදු දේපල රැකගැනීමේ වැඩසටහන
ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා, 28/1, බුලර්ස් පටුමග - කොළඹ 07.
ෆැක්ස් අංකය : 011 5 627 432 / 011 2 592 287
ඊමේල් : pppr2010@gmail.com වෙබ් අඩවිය : www.tisrilanka.org

'ශ්‍රී ලංකා පාලන වාර්තාව එළිදකී'

ශ්‍රී ලංකාවේ පාලනය සහ දූෂණයට අදාළ ගැටළු ගැන විග්‍රහ කෙරෙන 'පාලන වාර්තාව-2009' අන්තර්ජාතික දූෂණ විරෝධී දින (දෙසැම්බර් 09) එළිදක්වනු ලැබීය.

2009 වර්ෂය තුළ විවිධාකාර දූෂණ හේතුවෙන් රටේ ආර්ථිකයට හා සමාජයට එල්ලු වූ බලපෑම් පිළිබඳ සෘජුවයෙන් පසු පාලනමය කටයුතු අතින් පැන නගින අභියෝග, මාධ්‍ය නිදහසට එල්ල වී ඇති තර්ජන, මූල්‍ය සේවා ක්ෂේත්‍රයේ පාලනමය අර්බුද, ජාත්‍යන්තර දේශක තුළ ශ්‍රී ලංකාවේ ප්‍රතිරූපය ආදී විවිධ ක්ෂේත්‍රයන් රැසකුත් පිළිබඳවම මෙවර පාලන වාර්තාව මගින් සාකච්ඡාවට ලක්කර තිබේ.

ශ්‍රී ලංකාවේ යහපාලනයට අදාළ ගැටළු පිළිබඳ මහජන සංවාදයක් ඇතිකරලීමේ අරමුණින් සම්පාදනය කරනු ලබන මෙම වාර්තාව පිළිබඳ ලෞද්ගලික අංශය හා සිවිල් සමාජ සංවිධාන සහ ජනමාධ්‍යවේදීන් සමඟ සිදුකරන සංවාද මණ්ඩල දෙකක් ඉදිරි මාර්තු අවසානයේදී පැවැත්වීමට කටයුතු යොදා තිබේ.

ශ්‍රී ලංකාවේ පාලනය සඳහා දැනට පවතින නීති රීතිවල පවතින අඩුලුසුඩුකම් හඳුනාගැනීමට මූලික අරමුණ සලසමින් ඒවා සඳහා වන සංශෝධන ව්‍යවස්ථාදායකය හරහා ක්‍රියාත්මක කර ගැනීමටද සමත් වූවාය.

ඇගේ මූලිකම කාර්යභාරය වූයේ සත්ත්ව හිංසනය අවම කර සාධාරණත්වය ඉටුකරවා ගැනීමට පියවර ගැනීමය. මහා පරිමාණයෙන් සිදුවන ගව ඝාතනය හා ගවයන් ප්‍රවාහනය පසුපස ඇති ජාවාරම පුරවැසියෙකුටම භාෂණයේ නිදහසට සහ ප්‍රකාශනය ඇතැළු අදහස් පළකිරීමේ අයිතිය ක්‍රියාත්මක කරන ලද 'පොදු දේපල රැකගැනීමේ වැඩසටහන' වෙත පනාධිපතිවරණයට අදාළ පැමිණිලි 400 කට අධික ප්‍රමාණයක් ලැබී තිබූ අතර එයින් වැඩිම ප්‍රමාණය වාර්තා වී ඇත්තේ රජයේ වාහන හා ලංගම බස්රථ අයථා ලෙස යොදාගැනීම සම්බන්ධයෙනි.

ලැබී ඇති පැමිණිලි හා අපගේ විමර්ශණ අනුව පොදු දේපල අයථා පරිහරණයන් බහුතුවම සිදුවී ඇති සෙසු ක්ෂේත්‍ර වනුයේ මැතිවරණ කොමසාරිස්වරයාගේ නියෝග උල්ලංඝනය කරමින් සිදුකළ මැතිවරණ ප්‍රචාරක කටයුතු රාජ්‍ය ආයතන හා ගොඩනැගිලි අයථා පරිදි යොදාගැනීම ප්‍රමුඛ පෙළේ රාජ්‍ය නිලධාරීන් ඇතැළු රාජ්‍ය සේවකයන් මැතිවරණ කටයුතුවල යෙදීම ආදිය වේ.

මහජනතාවගෙන් අයකරන්නා බදු මුදල් විනාශ කරමින් ශ්‍රී ලංකාවේ මැතිවරණයන්හිදී සිදුකෙරෙන මෙම පොදු දේපල අයථා පරිහරණයන්හි අයහපත් වර්ධනයක් දක්නට ලැබෙන බවද ඒ පිළිබඳ අදාළ බලධාරීන්ගේ අවධානය යොමුවිය යුතු බවද පසුගිය

තොරතුරු දැනගැනීමේ අයිතිය .....

පළමු පිටුවෙන් .....

මේ වන විට ලංකාවේ රටවැල් 70 ක තොරතුරු පනත ක්‍රියාත්මක බවත් ඉන්දියාවේ ක්‍රියාත්මක පනත ඒ අතරින් හොඳම පනත බවත් කේජ්රිවාල් මහතා කීය.

එම නීතියට අනුව අයිතිවාසිකම් 05 ක් ජනතාවට හිමිය. ඒවා මෙසේය.

1. ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවකින් හෝ නිලධාරියෙකුගෙන් ඔබට තොරතුරු ලබාගත හැක.

2. ආණ්ඩුවේ ඕනෑම ලේඛනයක් පරීක්ෂා කිරීම සඳහා ඉල්ලා සිටිය හැක.

3. ආණ්ඩුවේ ඕනෑම ලේඛනයක ඡායා පිටපත් ලබාගත හැක.

4. ආණ්ඩුවේ වැඩකටයුතු හිරිත්ක්ෂණය කළ හැක.

5. ආණ්ඩුවේ වැඩකටයුතු යොදාගැනෙන ද්‍රව්‍ය සම්බන්ධ සාම්පල් ලබාගත හැක.

රටේ ඕනෑම පුද්ගලයෙකුට රුපියල් 10/-ක් ගෙවා අයදුම්පතක් ඉදිරිපත්කර එම තොරතුරු විමසීමේ අයිතිය ඇත.

එලෙස තොරතුරු විමසීමෙන් දින 30ක් ඇතුළත තොරතුරු ලබා නොදුනහොත් එක් දිනකට රුපියල් 250/- බැගින් තොරතුරු ලබා නොදුන් දින ගණනට දඩයක් නිලධාරියාට නියම වේ.

යම් ලෙසකින් එම නිලධාරියා අසම්පූර්ණ තොරතුරක්, නිවැරදි නොවන තොරතුරක් හෝ නොමඟ යවන තොරතුරක් හෝ ඉදිරිපත් කළහොත් එම නිලධාරියාට රුපියල් 25 000/-ක දඩයක් ගෙවීමට සිදුවේ.

තොරතුරු දැනගැනීමේ අයිතිය

සාමාන්‍ය ජනතාවට හිමි වරප්‍රසාද

ඉන්දියාවේ මේ වන විට ක්‍රියාත්මක වන තොරතුරු දැනගැනීමේ පනත හරහා එරට සාමාන්‍ය ජනතාවට හිමිව ඇති වරප්‍රසාද සමහරක් මෙසේය.

පාසලෙන් පිටව යාම

එක්තරා පාසලක සිසුවෙක් තම ගුරුවරයා සේවයට වාර්තා කිරීම පිළිබඳ කළකිරීමට පත්වී සිටියේය. පාසල පෙරවරු 10.00 සිට සවස 4 දක්වා විවෘතව තැබෙන නමුත් එම ගුරුවරයා පෙරවරු 11.00 ට පමණ සේවයට වාර්තා කර සවස 2 පමණ වනවිට පාසලෙන් පිටව යයි. මේ පිළිබඳ වෝදනාවක් නැගූ එම සිසුවාගේ සොහොයුරිය ගුරුවරයාගේ කටයුතු පිළිබඳ විමර්ශණයක් කිරීමට අවශ්‍ය යැයි ඉල්ලා ලිපියක් විදුලි‍ඛලදර්ශිවරයාට යොමු කළේය. ඇයට ඒ සඳහා දිනයක් ලැබුණු අතර ඒ අනුව පෙරවරු 11.00 ට පාසලට එන ලෙස දන්වනු ලැබිණ. නමුත් ඇය කියාසිටියේ ඇයට පැමිණිය හැක්කේ පස්වරු 4 ට බවය. ඒ සඳහා අවසර ලැබුණි. එදින ගුරුවරුන් සියළු දෙනාම පාසලට වාර්තාකර තිබූ අතර ඔවුන් සියළු දෙනාම පස්වරු 4 තෙක් පාසලේ රැඳුනහ. එක් දිනකට හෝ ගුරුවරුන් සියළු දෙනාම මුළු කාලය පුරාම පාසලේ රඳවා ගැනීමට හැකිවීම පිළිබඳ ඇය සතුට ඉවාය.

තම ගම්මානයේ සංවර්ධනය වෙනුවෙන් තොරතුරු දැනගැනීමේ අයිතිය භාවිතා කළ කාන්තාවක්

වියළි සලාකය

නන්නු නවවිද්‍යලයට නුදුරු ගමක පදිංචි දුප්පත් කම්කරුවෙකි. දිනක් තමන්ට වියළි සලාක ගොමුවියේ ලබාගැනීම සඳහා ලබාදී තිබූ කාඩ්පත ඔහු අතින් නැතිවිය. ඉන්පසු ඔහු ඒ වෙනුවට විකල්ප කාඩ්පතක් නිකුත් කරන ලෙස ඉල්ලා සිටීමට තීරණය කළේය.

ඒ අනුව ඔහු ඉල්ලීමපතක් ඉදිරිපත් කළේය. නීතියටත් අනුව ඉල්ලුම්පත ඉදිරිපත් කර දින 10 ක් ඇතුළත විකල්ප කාඩ්පත ඔහුට ලැබිය යුතුය. නමුත් තුන් මාසයක් යන තෙක් ඔහුට එය හිමිවූයේ නැත. ඔහු එම කාඩ්පත ලබාගැනීමට දෙපාර්තමේන්තුවට කිහිප වරක්ම ගිය නමුත් ඔහුට එය ලැබුණේ නැත.

එපමණකුදු නොව ඔහුට දෙපාර්තමේන්තුවට ඇතැල්වීමට පවා හොඳින් වීය. ඒ ඔහු දුප්පතෙක් වූ බැවිනි. අවසානයේදී ඔහු තොරතුරු දැනගැනීමේ අයිතියට අදාළව අයදුම්පතක් ඉදිරිපත් කිරීමට තීරණය කළේය.

විස්සපුර පාසලක් සඳහාවත් තම ගම්මානයේ ජනතාවගේ අදාශ්‍යක වාර්තා ඉල්ලා කැපී

එම අයදුම්පත ඉදිරිපත් කර දින 04 ක් ඇතුළත ඔහු හමුවීමට පැමිණි ආහාර හා සැපයුම් නිලධාරිවරයා ඔහුට අමතමින් 'තන්නු මහතාණෙනි, ඔබගේ කාඩ්පත සූදානම්. කරුණාකර කාර්යාලයට පැමිණ එය ලබාගන්න.' යැයි පැවසීය.

ඒ අනුව තන්නු තම කාඩ්පත ගැනීමට කාර්යාලයට ගියවිට ඔහුට දැඩි සැළකිලි හිමිවීය. කාර්යාලය ඇතුලට හෝ නොගෙන එළවා දැමුණු තන්නු හමුවීමට පැමිණි දිස්ත්‍රික් භාර නිලධාරිවරයා. ඔහුව තම කාමරයට කැඳවාගෙන ගොස් ඔහුට තේ කෝප්පයක්ද පිරිනැමීය.
ඉන් පසුව ඔහුට කාඩ්පත අතට දුන් නිලධාරියා මෙන්ම ඔබේ කාඩ්පත, මේ අයදුම්පතත් ගන්න යැයි පවසමින් තොරතුරු දැනගැනීමේ අයිතිය පිළිබඳ තන්නු දුන් අයදුම්පත ඔහු අතට පත්කළේය.

මෙවන් පුදුම සහගත වෙනසක් ඇතිවූයේ කෙසේද ? ඒය හිසකැවිම තොරතුරු දැනගැනීමේ අයිතිය තරහා හිමිවූ වරප්‍රසාදයකි. තන්නු හම අයදුම්පත මඟින් විමසා තිබුණේ ඉතා සරල ප්‍රශ්න 04 ක් පමණි.

ඉන් එක් ප්‍රශ්නයක් වූයේ අදාළ නිලධාරියා කවුද යන්නය. දෙවැන්න ප්‍රමාදයට හේතුව පැහැදිලි කරන ලෙසය. තෙවැන්න ඒ සම්බන්ධයෙන් මෙතෙක් පවතින ප්‍රගතියයි. අවසන් ප්‍රශ්නය වූයේ කෙදිනක කාඩ්පත ලැබේද යන්නයි.

නීතියට අනුව එම අයදුම්පත ලැබී දින 30 ක් ඇතුළත ඊට පිළිතුරු සැපයිය යුතුය. එසේ තොරතුරු ලබාදිය නොහැකි වුවහොත් දින 30 කට පසු දඩ ගෙවීමට නිලධාරියාට සිදුවේ.

එය එසේ නොවීමට වගබලාගත් නිලධාරීන් දින 04 ක් ඇතුළත තන්නුට කාඩ්පත ලබාදීමට පියවර ගත්තේය. පනත මගින් ජනතාවට ලැබී ඇත්තේ එවන් වරප්‍රසාදයකි.

මාග් පිළිසකර කිරීම ජනතාවගේ අධීක්ෂණයට

තමන් ගමන් කරන මාර්ගය දිනපතාම අලුත්වැඩියා කරනු උදය දුටුවේය. හමුත් එය අලුත්වැඩියා කර දින කිහිපයක් ගතවීමට පෙර යළි මාගය අබලන් වනු ඔහු නිරීක්ෂණය කළේය.

එයින් කෝපයට පත් ඔහු ප්‍රශ්න කිහිපයක් හඟමින් තොරතුරු දැනගැනීමේ අයදුම්පතක් ඉදිරිපත් කළේය. එක් ප්‍රශ්නයක් වූයේ මාග් ප්‍රතිසංස්කරණයට අදාළ ලිපිගොණු පරීක්ෂා කර බැලීමට අවශ්‍ය බවය. එමෙන්ම මාගය පරීක්ෂාවට ලක්කිරීමට අවශ්‍ය බවද ඔහු සඳහන් කළේය. උදය ඉල්ලා සිටි අකෙක් ඉල්ලීම වූයේ මාගය ප්‍රතිසංස්කරණයට යොදාගන්නා අමුද්‍රව්‍යවල තත්ත්වය පරීක්ෂා කිරීමට අවශ්‍ය බවය.

ඔහුට ඒ සඳහා ලේඛනවක් හා දිනයක් ලැබුණි. එම දිනයට දින 02 කට පෙර යළි මාගය අලුත්වැඩියා කරනු ලැබීය. පරීක්ෂාවට ගිය ඔහු හමුවූ ඉංජිනේරුවරයා ලිපිගොණු පරීක්ෂා කිරීමට අවශ්‍ය ඇයිදැයි විමසුවේ මාගය යළි අලුත්වැඩියා කරන ලද බව පවසමිනි.

එහෙත් ඉන් නොතෘප්තිමත් වූ උදය ලිපිගොණු පරීක්ෂා කර බලා එහි සිදුවා ඇති අක්‍රමිකතාවන් මෙන්ම යොදාගන්නා අමුද්‍රව්‍ය වල බාල තත්ත්වයද හෙළිදරව් කළේය.

විදේශ ගමන් බලපත්‍රය

ප්‍රේම් ජේමා විදේශ ගමන් බලපත්‍රයක් ලබාගැනීම සඳහා අයදුම්පතක් ඉදිරිපත් කළේය. නමුත් ගමන් බලපත්‍රය හිඟක් කිරීම සඳහා එහි නිලධාරියෙක් අල්ලසක් ඉල්ලා සිටියේය. ප්‍රේම් එය ලබාදීමට එකඟවුයේ නැත.

ඔර්මාට දින 45 කින් බලපත්‍රය ලැබිය යුතුව තිබිණි. නමුත් අල්ලස් ලබා නොදීම නිසා ගමන් බලපත්‍රය ලැබෙන තෙක් මාස 06 ක කාලයක් බලා සිටීමට ඔහුට සිදුවීය.

එයින් කළකිරුණු ඔහු තොරතුරු දැනගැනීමේ පනතට අනුව අයදුම්පතක් ප්‍රාදේශීය බලපත්‍ර කාර්යාලයට ඉදිරිපත් කළේය. අයදුම්පත ඉදිරිපත් කර පැය 24 ක් ගතවීමට පෙර එම කාර්යාලයේ නිලධාරියෙක් කථාකර දින කිහිපයක් අතැළුන බලපත්‍රය නොලැබුණහොත් තමන්ව අමතන ලෙස පවසමින් දුරකථන අංකයක් ලබාදුන්හෙය.

ආශ්චර්යයකි, දින 07 ක් ඇතුළත ප්‍රේමට ගමන් බලපත්‍රය ලැබුණි. තොරතුරු දැනගැනීමේ අයිතිය අතැළුත් පනහේ ප්‍රබලත්වය එයයි.

තොරතුරු දැනගැනීමේ අයිතිය පිළිබඳ කුම්පක් දැණුන් ක්‍රිමියක්

තොරතුරු දැනගැනීමේ පනත හරහා

සාමාන්‍ය ජනතාවට හිමි වරප්‍රසාද

'තොරතුරු හිදහස' නැතහොත් 'තොරතුරු වෙත ප්‍රවේශවීමේ හැකියාව' එසේත් නැතහොත් 'තොරතුරු දැනගැනීමේ අයිතිය' දියුණු ලෝකය තුළ සැළකෙන්නේ පුරවැසියෙකුට හිමිවිය යුතු මූලික අයිතිවාසිකමක් වශයෙනි.

මෙම තොරතුරු දැනගැනීමේ අයිතිය යටතේ පුරවැසියෙකුට තමන් ආණ්ඩුවට ගෙවන බදු මුදල් ආණ්ඩුව විසින් වියදම් කරන ආකාරය ගැන, එසේම තමන් විසින් බලයට පත්කර යවන මැති ඇමැතිවරුන් එම බලය පාවිච්චි කරමින් සිදුකරන දේවල් ගැන, ප්‍රදේශයේ මහාමාර්ග හා සෙසු යටිතල පහසුකම් වෙනුවෙන් වෙන්කරන මුදල් නිසි පරිදි එම කටයුතු වෙනුවෙන් යෙදවෙන්නේද යනාදී ඕනෑම කාරණයක් ගැන අදාළ බලධාරී ආයතන වලින් 'තොරතුරු' ඉල්ලා සිටීමට අයිතියක් හිමිවේ.

තොරතුරු දැනගැනීමේ අයිතිය යටතේ කිසියම් කරුණකට අදාළ ගිවිසුම්, ලොග් සටහන්, චක්‍රලේඛ, නියෝග, වාර්තා, විද්‍යුත් දත්ත ආදී ඕනෑම 'තොරතුරක්' පරීක්ෂා කර බැලීමට හා සහතික පිටපතක් ලබාගැනීමට අයිතියක් හිමිවන අතර අදාළ කටයුතු වලදී නිසි ආකාරයෙන් සිදුවී නැත්නම් ඒ ගැන බලපෑම් කිරීමටත්, දේශපාලඥයන් තමන්ගේ වරකීම් හරහැරී ඉටුකර නැත්නම් එළන මැතිවරණයේ ඡන්දය පාවිච්චි කිරීමේදී සුදුසු තීරණ ගැනීමටත් පුරවැසි‍ය-ට අවස්ථාවක් හිමිවේ.

ඒ අනුව ප්‍රතිපත්තිවාදය හෙවත් රටේ ආණ්ඩුකරණ ක්‍රියාවලියට පනතාවට සහභාගිවීමට ඇති හොඳම ප්‍රවේශයක් ලෙස මෙම තොරතුරු දැනගැනීමේ අයිතිය' සැළකිය හැකිය.

ලෝකයේ රටවල් රැසක් මේ වනවිට තොරතුරු දැනගැනීමේ අයිතිය පාවිච්චිමේනුත පනතක් වශයෙන් සම්මත කරමින් එම අයිතිය පනතාවට ලබාදී තිබේ. අයිලෙරිකා එක්සත් පනපදය, අයර්ලන්තය, උතුරුඩාව, ඕස්ට්‍රේලියාවේ නිව් සවුත්වෙල්ස්, දකුණු අප්‍රිකාව, බංග්ලාදේශය හා ඉන්දියාව ඊට නිදසුන් කිහිපයකි.

ශ්‍රී ලංකාවේ ආණ්ඩුකුම ව්‍යවස්ථාවේ 14 වැනි වගන්තිය අනුව 'සෑම පුරවැසියෙකුටම භාෂණයේ නිදහසට සහ ප්‍රකාශනය ඇතැළු අදහස් පළකිරීමේ අයිතිය හිමිකමේ හිඟෙන බව' සඳහන් වන නමුත් ශ්‍රී ලංකාවේ පුරවැසියන්ට තොරතුරු දැනගැනීමේ අයිතියක් ඇති බව ආණ්ඩුකුම ව්‍යවස්ථාව මගින් හෝ කිසිදු පාර්ලිමේන්තු පනතක් මගින් මෙතෙක් නිශ්චිතව හඳුනාගෙන නොමැත.

ආණ්ඩුකුම ව්‍යවස්ථාවේ සිතිමේ සහ ප්‍රකාශනයේ අයිතිය මූලික අයිතිවාසිකමක් ලෙස හඳුනාගෙන තිබීමෙන් තොරතුරු දැනගැනීමේ අයිතිය අභිගමාර්ථයෙන් දැක්වෙන බව ශ්‍රී ලංකාවේ ශ්‍රේෂ්ඨාධිකරණය විසින්ද අවස්ථා කිහිපයකදී සඳහන් කර ඇතත් අපේ ව්‍යවස්ථාදායකය තවමත් ඒ පිළිබඳ නෛතික ප්‍රතිපාදන සැලසීම පිළිබඳ සැබෑ උනන්දුවක් දක්වා නොමැත.

ගාළු මුවදොර තණහිල්ල පෞද්ගලික ආයතනයකට බදුදීම ගැන තොරතුරු ලබාදීම නාගරික සංවර්ධන අධිකාරිය මගින් ප්‍රතික්ෂේප කිරීමට එරෙහිව සීමාසහිත පාරිසරික පදනම ගොණුකරන ලද ශ්‍රේෂ්ඨාධිකරණ නඩුවේදී (SC(FR)Acc 47/2004) ප්‍රකාශයයේ අයිතිය හා තොරතුරු දැනගැනීම අතර අනෙන්හය සම්බන්ධතාවක් පවත්නා බව ශ්‍රේෂ්ඨාධිකරණය මගින් පිළිගනු ලැබූ අතර තොරතුරු දැනගැනීමේ අයිතිය නොමැති වීමේ ප්‍රකාශයයේ අයිතියද පැහැදිලිව අවහිර වන බව පෙන්වා දෙනු ලැබීය. ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවට එරෙහිව විමල් ප්‍රනාන්දු නඩුවේදීද (1983) මේ පිළිබඳ දීර්ඝ වශයෙන් සාකච්ඡාවට ලක්විය.

1994 බලයට පත් චන්ද්‍රිකා කුමාරතුංග ආණ්ඩුව විසින් පත්කල ආර්.කේ.ඩබ්. ගුණසේකර කමිටුව මගින් ශ්‍රී ලංකාව තොරතුරු දැනගැනීමේ පනතක අවශ්‍යතාව පැහැදිලිව දැක්විය.

ශ්‍රී ලංකාවේ මාධ්‍ය සංවිධාන විසින් ජනමාධ්‍ය නිදහස සඳහා අරගය නිති ප්‍රතිසංස්කරණ ගැන සාකච්ඡාවට ලක්කළ සෑම අවස්ථාවකදීම තොරතුරු දැනගැනීමේ අයිතිය පිළිබඳ පනතක අවශ්‍යතාව දිගින් දිගටම අවධාරණය කර ඇත. 2003 වසරේදී එවකට පාවතිව රනිල් වික්‍රමසිංහ ආණ්ඩුවේ කැබිනට් මණ්ඩ